**සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

**2026 වර්ෂය**

**නාගරික සංවර්ධන අධිකාරිය**

**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය**

1. නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2026 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන්, ප්‍රාදේශීය වශයෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරවා ගැනීම උදෙසා සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය විසින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය (Shopping Bidding Method) යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **අයදුම්පත්/උපදෙස් හා කොන්දේසි**

**අ. අයදුම්කරුවන් 2025 වර්ෂයේ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත්තම්, <u>ලියාපදිංචිය අලුත් කිරීමේ අයදුම්පත පමණක් සම්පූර්ණ කර ඒ සමග අයිතම ගාස්තු ගෙවූ මුදල් තැන්පතු පත්‍රිකාව/කුවිතාන්සියේ මුල් පිටපත සමග අයදුම්පත එවිය යුතුය.</u>(2025 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගේ සාරාංශ ලේඛනය හා 2026 වර්ෂයේ අයිතම ලැයිස්තුව(Item List ) <u>www.uda.gov.lk</u> - Procurement Notices වෙත උඩුගත කර ඇත. (Upload)**

**ආ. 2025 වර්ෂයේ ලියාපදිංචි වී නොමැති අයදුම්කරුවන්ට, 2025.10.01 දින සිට 2025.10.31 දින දක්වා කාලය තුල පහත සඳහන්"වෙබ්" අඩවියට පිවිස එහි "*Procurement Notices*"හරහා ලියාපදිංචිවීමට අවශ්‍ය අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි අයකිරීමකින් තොරව ලබාගත හැක(Download).**

නාගරික සංවර්ධන අධිකාරිය - **<u>www.uda.gov.lk</u> - Procurement Notices**

ඇ. ලියාපදිංචිවීමට අදාළ අයදුම්පත සහ ලියකියවිලි කට්ටලය පහත සඳහන් කොටස් වලින් සමන්විතවේ.

- i. ලියාපදිංචිවීමේ අයදුම්පත
- ii. උපදෙස් සහ කොන්දේසි අඩංගු පත්‍රිකාව
- iii. අයිතම ලැයිස්තුව (ඉංග්‍රීසි බසින්)

ඉහත සඳහන් ලියකියවිලි "වෙබ්" අඩවිය හරහා ලබා ගැනීම පිළිබඳ අයදුම්කරුවෙකුට යම්කිසි ගැටළුවක් ඇත්නම් නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයේ පහත සඳහන් නිලධාරී අමතන්න.(කාර්යාල වේලාවන් තුල පමණි)

- **සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - නාගරික සංවර්ධන අධිකාරිය**

**සෘජු දුරකථන අංක – 011 2873649**

| | | | |
|---|---|---|---|
| **011 2875916-20** | **011 2873651-2** | **011 2873644** | |
| **011 2873649** | **011 2875333** | **011 2797200** | දිගුව - **2682** |

3. **ලියාපදිංචිය සඳහා අයිතම ගාස්තු ගෙවීම**

අ.. **එක් අයිතමයක් සඳහා ලියාපදිංචිවීමේ ගාස්තුව ලෙස රු. 1,200.00 මුදලක් අයකරනු ලැබේ. (2.5% (සමාජ ආරක්‍ෂන බද්ද) සහ 18% (එකතු කල අගය මත බද්ද)<u>ඇතුළුව</u>)**

ආ. **2026** වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම සඳහා අයිතම ගාස්තු, ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක **1534** දරණ ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත්/දිස්ත්‍රික් කාර්යාලයන්ට ගෙවිය හැක.

ඇ. **<u>අයිතම ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාව/කුවිතාන්සියේ මුල් පිටපත, අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කලයුතුය</u>.**

ඈ. අයදුම්කරුවන් විසින් **2025.11.30** දිනට හෝ ඊට ප්‍රථම අයිතම ගාස්තු ගෙවා අවසන් කල යුතුය. **<u>2025.11.30 දිනට පසුව ගෙවනු ලබන අයිතම ගාස්තු පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය වගකියනු නොලැබේ.</u>**

**4.** නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලිපිලේඛණ සමග **2025.11.30** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් බාරදිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ‘‘සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-**2026** වර්ෂය’’යනුවෙන් සඳහන් කලයුතුය.

නාගරික සංවර්ධන අධිකාරිය,
ප්‍රසම්පාදන ඒකකය,
**7** වනමහල,
‘‘සෙත්සිරිපාය‘‘
බත්තරමුල්ල.

**5.** **2026** වර්ෂයට, නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

**6**. අවම වශයෙන් දින **30** ණය සහන කාලයක් ලබා දෙනු ලබන ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය
**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය**

නාගරික සංවර්ධන අධිකාරිය
ප්‍රසම්පාදන ඒකකය,
7 වන මහල
‘‘සෙත්සිරිපාය‘‘
බත්තරමුල්ල.

2025 ඔක්තෝබර් මස 01 වන දින